# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1882/17 - 2014 සැප්තැම්බර් මස 30 වැනි අඟහරුවාදා - 2014.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

3 වන වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් :

(අ) එම වගන්තිය යටතේ පනවන ලද 2014 මැයි 26 දිනැති අංක 1864/2 දරන *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශිත නියෝගය පරිච්ඡින්න කිරීම ; සහ

(ආ) එම වගන්තිය යටතේ පනවන ලද අවසන් වරට සංශෝධනය කරන ලද 2013 මැයි 10 දිනැති අංක 1809/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද, 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 1465/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත නියෝගය උපලේඛනයේ දක්වා ඇති පරිදි සංශෝධනය කිරීම කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 29 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය.

**උපලේඛනය**

එම උපලේඛනයේ 06 අයිතමය පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ :-

"06. යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක්.

එවැනි කොටස්වල මුළු වටිනාකමෙහි සෑම රු.1000 ක් හෝ ඉන් කොටසක් සඳහා එවන් මාරු කිරීමක් හෝ පැවරීමක් නිකුත් කරන දිනට විවෘත වෙළඳපොළේ එවන් කොටස් සඳහා උපයා ගත හැකි වනු ඇතැයි තක්සේරුකරු/සහකාර කොමසාරිස්/නියෝජ්‍ය කොමසාරිස්/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් නිගමනය කරනු ලබන වටිනාකම.". — රු.5.00

10 - 642


1A - PG 2176 — 600 (2014/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*